

# ආබාධිත රණවිරුවනට අත හිත

ඔස්ට්‍රේලියාවේ ඊසීසී පදනමේ ප්‍රථම ව්‍යාපෘතිය වූ ආබාධිත රණවිරුවන්ට හා යුද්ධයේදී මිය ගිය රණවිරු පවුල් සහ දූ දරුවනට අධ්‍යාපන උපකරණ පිරිනැමීම 2011 නොවැම්බර් මස 12 වන දින කුරුවිට ශ්‍රී ලංකා ගැමුණු හේවා බලකා මූලස්ථානයේදී පවත්වන්නට යෙදුනි.

මේජර් රාජගුරු මහතා විසින් සම්බන්ධීකරණය කළ මේ ව්‍යාපෘතිය සඳහා මූලස්ථාන භාර නිලධාරි කර්නල් බණ්ඩාර මහතා ඇතුළු අනෙකුත් නිලධාරීන්ගෙන් ලැබුණ සහය අගය කළ යුතුය. ඔවුන් සියලු කටයුතු ඉතා අලංකාර ලෙස සංවිධානය කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය සඳහා ඊසීසී පදනම ආධාර මුදල් රැස්කරගත්තේ උදයකාන්ත වර්ණසූරියගේ චැලෙන්ජස් සිනමා පටය මෙල්බන් නුවර තිරගත කිරීමෙනි. උදයකාන්ත වර්ණසූරිය මහතාද මේ අවස්ථාවට ආරාධිතයකු වශයෙන් සහභාගි විය.



දැනට ගැමුණු සේවා බලකාය තුළ ආබාධිත සෙබළුන් 4200 ක් පමණ සිටින අතර ආබාධිත නිලධාරීන් 135 දෙනෙක්ද සිටිති. මේ අයට සහ යුද්ධයේදී මියගිය රණවිරු පවුල් වලට ආධාර උපකාර කිරීම අප සතු යුතුකමක් යයි අපි සිතමු. ඔවුන්ට



ECC පදනමේ අනුර කුලසේකර මහතා සභාව අමතමින්





අවශ්‍ය කරන උපකරණ හා අනෙකුත් දේ විවිධාකාර ය. කඳවුර තුළම ඔවුන්ට භෞත චිකිත්සාගාරයක් ඇති මුත් එහි උපකරණ ප්‍රමාණවත් නොවේ.

මේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය අරමුදල් රැස්කර ගැනීම සඳහා බලසේනා මූලස්ථානය තුළ කරගෙන යනු ලබන ව්‍යාපෘති අතර මල් පෝච්චි සෑදීම කොසු ඉදල් සෑදීම විසිතුරු බඩු නිපදවීම වැනි ව්‍යාපෘති දක්නට හැකි ය. මේ නිෂ්පාදන වල ගුණාත්මකභාවය ඉතා ඉහළ අතර වෙළඳපලේ මිලට වඩා අඩු මිලකට මිලට ගැනීමේ හැකියාවද ඇත . මේ භාණ්ඩ මිලට ගැනීම ඔවුනට ලබා දෙන ධෛර්යයක්ද වෙයි.

ආබාධිත සෙබළුන් විසින් ඔවුන්ගේ ශ්‍රමයෙන් සහ වියදමින් ඉතා අගනා විහාරස්ථානයක් කඳවුරු භූමිය තුළ ඉදිකර ඇති ඇත . ඉතාමත් දක්ෂ ලෙස නිමවා ඇති සඳකඩ පහණ කාගේත් සිත් ඇද ගනියි.

ඊසීසී පදනම ඉදිරියේදීත් ඔවුන් හා අත්වැල් බැඳ ගනිමින් ඔවුනට අවශ්‍ය ආධාර උපකාර සපයන්නට අදිටන් කරගෙන සිටියි. වසර ගණනාවක් අපේ මාතෘ භූමිය වෙලා ගත් යුද්ධායේ සාපයෙන් අප ගලවාගත් මේ රණ විරුවනට අපට කළ හැකි හොඳම උපහාරයද එයයි. මේ වගකීම ඉටු කිරීම සඳහා ඔබ සැමගේද සහය අපට ලැබෙනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

කර්නල් බණ්ඩාර මේජර් දයාවංශ මේජර් රාජගුරු මේජර් කපුරුගේ කැප්ටන් කුමාර ඇතුළු නිලධාරීන්ටද ස්තුතිවන්ත වෙමු.

ECC පදනම

YSL
Migration
Services

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956
0430 359 006

(Close to Latrobe university , RMIT and NMIT)
6 Mat Rush Avenue, Bundoora, VIC 3083
Tel: 03 9467 4468
yasho@yslmigration.com

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA